**මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව - 2020**

-----------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් විස්තරාත්මක කළමනාකරණ වාර්තාවේ පහත අංක යටතේ සඳහන් කර තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.
1.2.2(ආ),(ඇ), (ඈ), (ඉ), 1.2.3, 1.2.4, 1.2.5(අ) (i) හා (ආ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල නිදර්ශනාත්මක ආකෘතිවලට අනුකූලව පිළියෙල කර නොතිබූ අතර ඒ අනුව ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස් වීම් හා පූර්ව කාල පරිච්ඡේදවල වැරදි හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.671,475,941 ක් හා ප්‍රාග්ධනයට ආධාරවලින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.45,954,605 ක් ස්කන්ධය ලෙස සංචිත හා වෙන්කිරීම් යටතේ දක්වා නොතිබුණි. | ඉදිරියේදී ගිණුම් සැකසීමේදී නිවැරදිව ආකෘතිපත්‍ර සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ප්‍රමිති අනුව ගිණුම් සකස් කිරීමට අදාල පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 22 දිනැති අංක LGD/10A/4/න.ගි./2019 දරන ලිපිය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබුණි. | නව ගිණුම්කරණ ප්‍රමිත අනුව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් වෙන් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. | |
| (ඇ) | අංක 9.9 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 10 යටතේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම්වලින් වර්ෂයේ කළ ගෙවීම්, අතිරික්තයේ හඳුනාගත් ප්‍රදාන ලෙස අඩුකොට ඉතිරිය ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ වූ, අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන ලෙස සටහන් කළ යුතු විය. එහෙත් ලැබුණු බාහිර ප්‍රාග්ධන වියදම් | ඉදිරියේදී ගිණුම් සැකසීමේදී නිවැරදිව ආකෘතිපත්‍ර සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |

ප්‍රදාන රු.131,784,289 ක් වුවද සභා අරමුදල්ද ඇතුළත් මුළු ප්‍රාග්ධන වියදම්, රු.250,485,961 ක් ලැබුණු ලෙස දක්වා ඉතිරිය දක්වා නොතිබුණි.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් යටතේ සටහන් අංක 4 වැටුප් ප්‍රතිපූර්ණ රු.61,542,000 ක් දැක්වීම වෙනුවට අවුරුදු ගණනාවක සිට පැවත එන 2020 ජනවාරි 01 දිනට හිමිකම් ශේෂයක්වූ රු.45,954,605ක පරිත්‍යාගවල වටිනාකම දක්වා තිබූ අතර ඒ අනුව අතිරික්තය රු.15,587,395 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අතපසුවීමකින් වැටුප් ප්‍රතිපූර්ණ රු.61,542,000 ක් දැක්වීම වෙනුවට 2020 ජනවාරි 01 දිනට හිමිකම් ශේෂයක්වූ රු.45,954,605 ක පරිත්‍යාගවල වටිනාකම දක්වා තිබූ බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | සටහන් අංක 8 අනුව සමාලෝචිත වර්ෂයේ රු.121,330,668 ක් වූ මුළු වියදම, පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් වූ සටහන් අංක 5 යටතේ අයභාරය ලෙස දක්වා තිබීමෙන් එම වටිනාකමින් අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි. | සටහන් අංක 8 යටතේ දක්වා ඇති රු.121,330,668 ක් වූ මුළු වියදම අතපසුවීමකින් සටහන් අංක 5 යටතේද සටහන් වී ඇති බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | හුවමාරු නොවන ගණුදෙනුවලින් වන අයභාරය දක්වන සටහන් අංක 6 හා හුවමාරු ගණුදෙනුවලින් වන අයභාරය දක්වන සටහන අංක 7 යන සටහන් දෙක තුළම ස්ථාවර තැන්පත් පොළී හා විකුණුම් ආදායම වූ රු.5,232,570 ක් දක්වා තිබීමෙන් එම වටිනාකම ද්වි ගණනය වී තිබීම නිසා අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | සටහන් අංක 6 හා 7 හි දෙවරක් සටහන් වී ඇති වටිනාකම් අංක 7 යටතේ වෙනත් විකුණුම් ආදායම් යටතේ පමණක් සටහන් කර ඇති බව දන්වමි. | |
| (ඈ) | ප්‍රාග්ධන වියදම් සඳහා වූ පළාත් සභා ප්‍රදාන රු.131,789,289 ක් සටහන් අංක 10 දැක්වීම වෙනුවට සටහන් අංක 6 හුවමාරු නොවන ගණුදෙනුවලින් වන අයභාරය ලෙස දක්වා තිබීමෙන් අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නව ආකෘතිපත්‍ර වල ප්‍රාග්ධන ආදායම් සඳහා වූ පළාත් සභා ප්‍රදාන රු. 131,784,289 ක් සටහන් අංක 5 යටතේ දක්වා ඇති බව දන්වමි. | |

| | | | |
|---|---|---|---|
| (ඉ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් 4,5,6 හා 7 මුළු එකතුව වූ රු.575,624,676 ක් දෙවරක් එකතු කර තිබීමෙන් අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නව ගිණුම් ආකෘති සඳහා වටිනාකම් ඇතුළත් කිරීමේදී සැලකිලිමත් වන ලෙස උපදෙස් ලබා දෙන ලද බව දන්වමි. | |
| (ඊ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් අංක 9 මගින් රු.17,666,031 ක් මුල්‍ය පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබුණද රු.15,734,593 ක් වූ පෙර ගෙවුම් ඒ තුළ ඇතුලත් වීමෙන් එම වටිනාකමින් වියදම් වැඩියෙන් හා අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වරද නිවැරදි කර ඉදිරිපත් කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | පෙර ගෙවුම් හා අත්තිකාරම් රු.15,734,593 ක් ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පෙර ගෙවුම් හා අත්තිකාරම් රු.15,734,593ක වටිනාකම නව ආකෘතිපත්‍රවලට වටිනාකම් ඇතුළත් කිරීමේදී අතපසු වී ඇති බව දන්වමි. | |
| (ඌ) | ජංගම නොවන ආයෝජනවල වටිනාකම රු.211,539,943 ක් ලෙස දක්වා තිබුණද ස්ථිර තැන්පත් ආයෝජනවල පොලිය, මුහුණත වටිනාකමට එකතුවීමේ ක්‍රමයට සිදු කෙරෙන බැවින් 2020 දෙසැම්බර් 31 දිනට ඉපයූ පොලිය රු.4,192,209 කින් ආයෝජන අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගණනය කර ඉදිරියේදී නිවැරදි කර ඉදිරිපත් කරන බව දන්වමි. | |
| (එ) | ණයගැතියෝ රු.45,100,303 ක් වත්කම් ලෙස ගිණුම්ගත කිරීම අත් හැරී තිබුණි. | සටහන් අංක 12 යටතේ ණයගැතියෝ රු. 46,621,024 ක් විය යුතු බව දන්වමි. | |
| (ඒ) | කෙටි කාලීන ගෙවියයුතු ගිණුම් 06 කට අදාල රු.3,405,804 ක ශේෂය වගකීම් යටතේ ගිණුම්ගත කිරීම අත් හැරී තිබුණි. | අතපසුවීමකින් නව ප්‍රමිත වලට සකසන ලද ආකෘතිපත්‍රවලට ඇතුළත් වී නැති බව දන්වමි. | |

| | | | |
|---|---|---|---|
| (ඔ) | කර්මාන්ත සඳහා 2020 ණයහිමි රු.68,343,327 ක් වත්කම් හෝ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කිරීම කරනු වෙනුවට වියදම් ලෙස ගිණුම් ගතකොට තිබුණි. | මෙම කර්මාන්ත සඳහා 2020 වර්ෂයේදී ගිවිසුම් ගත වී ඇති බැවින් 2020 වර්ෂයේ වියදම් ලෙස ගෙන ගිණුම් ගත කර ඇති බව දන්වමි. | |
| (ඕ) | බැංකු සැසදුමෙහි උප කාර්යාල ගිණුම්වලින් ප්‍රධාන කාර්යාල ගිණුමට මාරු නොවූ මුදල් ලෙස රු.18,394 ක් බැංකු ප්‍රකාශය අනුව ශේෂයට එකතු කර තිබූ අතර මීනුවන්ගොඩ උප කාර්යාලයේ මාර්ගගත ක්‍රමයට (On line) ප්‍රධාන කාර්යාලයේ ගිණුමට ගෙවා තිබූ රු.3,389 ක් බැංකු ශේෂය තුළ ඇතුළත් බැවින් මුදල් පොතේ ශේෂය ලබා ගැනීම සඳහා අඩුකළ යුතු වුවත් එය එකතු කිරීම මගින් මුදල් ශේෂය දෙගුණයකින් එනම් රු.6,778 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඇති බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

1.6 .3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.233,167,499 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාල ශේෂයන් හා ඒවාට අදාල උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.82,974,773 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 අවසාන ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.2,893,536 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2021 අවසාන ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.1,012,252,654 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 160,213,391 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

-------------------------------

3.1.1 භාණ්ඩ හා සේවා

---------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොම්පෝස්ට් බින් 78 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් 03 ක් ලැබී අඩුම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව 2020 ජූලි 15 දින නිර්දේශ කර අඩුම මිල එකක් රු.4,750 ක් වශයෙන් තිබියදී, මිල ගණන් ඉදිරිපත් කර නොතිබූ වෙනත් පුද්ගලික ආයතනයකින් එකක් රු.5,106 බැගින් රු. 398,268 ක් ගෙවා 2020 දෙසැම්බර් 21 දින මිලදී ගෙන තිබුණි. | මීට පෙර ලබා ගත් ආයතනයේ එම බඳුනේ ප්‍රමිතිය , 2020 වර්ෂයේ මිලදී ගැනීමට නිර්දේශ වූ ආයතනයේ සාම්පලයට වඩා ප්‍රමිතියෙන් ඉහළ බැවින් එම ආයතනයෙන් මිලදී ගැනීමට තීරණය කළ බව දන්වමි. | ප්‍රසම්පාදන කමිටුවේ තීරණ ක්‍රියාත්මක කළ යුතුවේ. |